## 13 ශ්‍රේණිය ව්‍යාපාර අධ්‍යයනය

## 18.1 ව්‍යාපාර සැලැස්මක මූලිකාංග විමසමින් ව්‍යාපාර අදහසට උචිත ව්‍යාපාර සැලැස්ම පිළියෙල කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි.

### ව්‍යාපාර අදහස-

පුද්ගලයෙකුගේ හෝ සංවිධානයක හෝ අවශ්‍යතාවක් හෝ වුවමනාවක් ඉටුකළ හැකි නිෂ්පාදිතයක් පිළිබඳව ව්‍යවසායකයකු තුළ ඇතිවන සිතිවිල්ල ව්‍යාපාර අදහසක් ලෙස හැඳින්විය හැකිය.

### සාර්ව විශ්ලේෂණය-

ව්‍යාපාර අදහස් සියල්ල අතරින් යෝග්‍ය ව්‍යාපාර අදහස හඳුනාගැනීම සඳහා සියලුම අදහස් ඇගයීමට ලක් කිරීම සාර්ව විශ්ලේෂණය ලෙස හැඳින්වේ.මෙහිදී ව්‍යාපාරයේ බාහිර පරිසර සාධක අනුව ඇගයීමක් කළ යුතුය.

### ව්‍යාපාර සැලැස්ම

ව්‍යාපාර සැලැස්මක් යනු ව්‍යාපාරයක අරමුණු හා පරමාර්ථ ද ,ඒවා ළඟා කර ගන්නා ක්‍රමෝපායන් ද විස්තර කෙරෙන ලේඛනයකි.මෙය ව්‍යාපාරයේ අදහස,ගමන්මඟ දැක්වෙන මාර්ග සිතියමකි.

අභ්‍යාස

1.ව්‍යාපාර සැලැස්මක වැදගත්කම පැහැදිලි කරන්න.

2.ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?

3.ව්‍යාපාර සැලැස්මක ඇතුළත්විය යුතු අංග මොනවාද?